*සැ. යු.*- 2013.09.20 දින පළ වූ අංක 1,829 දරන *ගැසට් පත්‍රයේ* IV ( අ ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,830 - 2013 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2013.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1870 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1883 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ඔක්තෝබර් මස 17 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ඔක්තෝබර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## මතුගම ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

මතුගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මතුගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පදිංචි අය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

| | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | සැහැල්ලු වාහන රියදුරු II (ආ) | 02 | PL 3(2006A)<br>රු.12,470 - 130 x 10 - 145 x 10 - 160 x 10 - 170 x 12 - රු.18,860 (රු. 12,990ට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය) ආරම්භක වැටුප් පියවර මාසිකව රු. 12,470 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් අටවන ශ්‍රේණිය/නවය වසර සමත් වී සිටිය යුතුය. | I. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය.<br>II. දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු පොලිස් රථ වාහන පරීක්ෂක වරයෙකු පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන්ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමන්විත විය යුතුය. |
| 02 | යන්ත්‍ර ක්‍රියාකරු III | 01 | PL 2(2006A)<br>රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 -රු. 18,600 (රු. 12,600 වාර්ෂික වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය) මෙම වැටුප් ක්‍රමය බඳවා ගැනීම් පරිපාටිය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත සේවක සංඛ්‍යා තොරතුරු අනුව පරස්පරවේ. එබැවින් මෙම වැටුප් ක්‍රමය වෙනස් වීමට ඉඩ ඇත. | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වී තිබීම.<br>*බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් දෙකක් සමත්වී තිබීම. | I. තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.<br>II. අවම උස අඩි 5 අඟල් 6<br>III. තනතුරට අදාළ බර යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම. (රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක් පළාත් පාලන ආයතනයක් රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතන පිළිගත් ආයතන ලෙස හැඳින්වේ.<br>IV. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතු ය. |

| | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 03 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | PL 2 (2006A)<br>රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 -රු. 18,600 (කාර්යක්ෂමතා කඩඉම හතරවන පියවරට එළඹීමට පෙර සමත් විය යුතුය.) ආරම්භක වැටුප් පියවර මාසිකව රු. 12,210 | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>*(ආ)* අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වී තිබීම.<br>*සහ*<br>තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)<br>*බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>*(අ)* ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් දෙකක් සමත්වී තිබීම.<br>*සහ*<br>තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම, (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.) | තනතුරට අදාළ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම .<br>(දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ) |

02. මතුගම ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවය කරනු ලබන අනියම්, ආදේශක හෝ ව්‍යාපෘති පදනම මත සේවය කරනු ලබන අයගේ අයදුම්පත් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

*03. වයස :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු:. 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතු ය.
(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

*04. වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(iii) අයදුම්කරු ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට බස්නාහිර පළාත තුළ වසර 3 කට නොඅඩු කාලයක් තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ග්‍රාම නිලධාරි/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.)

(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතු ය.

(vi) අවශ්‍ය වෙතොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් තැබීමට සූදානම් විය යුතු ය.

*05. පොදු කොන්දේසි :-*

(i) මනා පෞර්ෂයකින් යුක්ත විය යුතුය;
(ii) මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය;
(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය;
(iv) පරිවාස කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ;
(v) බඳවා ගැනීමෙන් පසුව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් ව්‍යාජ හෝ අසත්‍ය බවට තහවුරු වුවහොත් වෙනත් කිසිම දැනුම් දීමකින් තොරව පත්වීම් අවසන් කරනු ලැබේ.

*06. ඉහත තනතුරුවලට බඳවා ගැනීමේ ක්‍රම :-*

6.1 රියදුරු - සැහැල්ලු වාහන රියදුරන් II ආ පන්තිය - බඳවා ගැනීමේ ක්‍රමය

6.1.1 දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත්විය යුතුය.

6.1.2 24/95 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දැක්වෙන උපදෙස්වලට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

6.2 යන්ත්‍ර ක්‍රියාකරු - බඳවා ගැනීමේ ක්‍රමය

6.2.1 යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට අදාලව තිබිය යුතු පොදු සුදුසුකම් අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය හා වෙනත් සුදුසුකම් ඇති අයදුම්කරුවන් වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබා ගන්නා කුසලතාවය මත II ශ්‍රේණියට බඳවා ගැනේ.

6.3 ආදාහනාගාර ක්‍රියාකරු - බඳවා ගැනීමේ ක්‍රමය

6.3.1 ඉහත පොදු සුදුසුකම් හා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඇති අයදුම්කරුවන් කැඳවා ප්‍රායෝගික පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ඉන් ලබන කුසලතාවය මත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

*07. අයදුම්පත් :*

අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2013.10.15 වැනි දිනට පෙර "ලේකම් ප්‍රාදේශීය සභාව - මතුගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය." ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

08. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

09. අයදුම්පත් සමග පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික ;
*(ඇ)* පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය/ඡන්ද නාම ලේඛනයේ පිටපත;
*(ඈ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාමසේවා නිලධාරියාගෙන් විය යුතුය)
*(ඉ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය.

10. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

11. බඳවා ගන්නා දිනට ඇතිව තිබෙන සියලුම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන බැවින් ඉහත සඳහන් තනතුරුවල සංඛ්‍යාවන් වෙනස් වීමට ද ඉඩ තිබේ.

අසෝක රණසිංහ,
ලේකම්,
මතුගම ප්‍රාදේශීය සභාව.

2013 අගෝස්තු මස 29 වැනි දින,
මතුගම ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*මතුගම ප්‍රාදේශීය සභාව*

*............................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. තැපැල් ලිපිනය :——————.
03. උපන් දිනය
    වර්ෂය:——————. මාසය:——————. දිනය:——————.
04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස: ——————.
    අවුරුදු:——————. මාස:——————. දින :——————.
05. විවාහක/අවිවාහක බව:——————.
06. ජාතිය:——————.
07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:——————.
08. අධ්‍යාපන සුදුසුකම්:——————.
09. වෘත්තීය සුදුසුකම්:——————.
10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,
    (i) දැනට දරන තනතුර:——————.
    (ii) එම තනතුරට පත් වූ දිනය:——————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ පදනම මතද):——————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

——————.

අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

09-958

---

## පාලින්ද නුවර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු තනතුරු පුරප්පාඩු

පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩුවී ඇති රියදුරු තනතුරට බඳවා ගැනීම සඳහා අදාළ අවම සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියැදුරු | 01 | රු. 12,210 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,600 | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>1. අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම.<br>*බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේදී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ) විභාගයේදී කුමන හෝ විෂයයන් 2කින් සමත් වී තිබීම. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | වෘත්තීය හෝ වෙනත් සුදුසුකම් :<br>(i) බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br>(ii) අවම උස අඩි 5 අඟල් 6ක් විය යුතු ය.<br>(iii) බඳවා ගැනීමට යෝජිත තනතුරට අදාල අංක එක යටතේ සඳහන් බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීනතාවයක් ලබා තිබීම. පිළිගත් ආයතන වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක් , අර්ධ රාජ්‍ය ආයතනයක්, පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අය සඳහා උපරිම වයස් සීමාවක් බලපවත්වන්නේ නැත.).
(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
(iii) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද සහතිකයකින් සනාථ විය යුතු ය.).
(iv) පාලින්ද නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන් වෙනුවෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(v) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
(vii) රජයේ පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.
(viii) පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(ix) අයදුම්කරුවන් එම තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
(x) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නව වසර 05ක සේවා කාලයක් තුළ පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(xi) පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන ආයතනයක රාජකාරි ආවරණය කරන්නේ නම් තනතුරට අදාල පළපුරුද්දක් හෝ පුහුණුවක් ලබා තිබේ නම් එය විශේෂ පුහුණුවක් වශයෙන් සලකනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජය හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි සහ නියෝගවලට ද, අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතු ය.
(iv) සේවයට බැඳුණු භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් සේවයට බැඳී වසර 05ක් තුල ලබා සිටිය යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව ලිඛිත වෘත්තීය හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
(ii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල්පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය :-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
4. මැතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
5. වෘත්තීය හෝ පළපුරුද්ද තිබේ නම් එම සහතික ;
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් නම්, අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*අයදුම්පත්‍ර එවීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.10.17 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පාලින්දනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය සතු වේ.

ඒ. එන්. පැලවත්ත,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

2013ක් වූ සැප්තැම්බර් මස 06 වන දින,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ......................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :——————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි ලිපිනය :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. විවාහක/අවිවාහක බව:——————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————.
06. උපන් දිනය: අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.
07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————.
08. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————.
(ii) සමත් වූ වර්ෂය හා විභාග අංකය :——————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

වෙනත් සුදුසුකම් : ——————.

09. වෘත්තීය සුදුසුකම් : ——————.
10. සේවා පළපුරුද්ද : ——————.
    (i) දැනට සේවය කරන ආයතනය:——————.
    (ii) දැනට දරන තනතුර:——————.
    (iii) එම තනතුරට පත්වූ දිනය:——————.
    (iv) පෙර සේවය කරන ලද ස්ථානයේ දරන ලද තනතුර:——————.

______________
අයදුම්කරුගේ අත්සන.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පහත ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන .................................................................................... මයා. /මිය. /මෙනවිය මෙම ආයතනයේ ..................................................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය මොන ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

______________________,
ආයතන ප්‍රධානියා.

නම :——————————.
පදවිය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————.

09-1105

## ජා ඇල ප්‍රාදේශීය සභාව - කඳාන

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, ජාඇල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

උපලේඛනය

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :* |
| 01 | මෝටර් කාර්මික ශිල්පීය III ශ්‍රේණිය | 01 | PL-3-2006 -A රු. 12,470 - 10 x 130-10 x 145 -10 x 160 - 12 x 170 -රු.18,860/- (හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර(සා.පෙළ) විභාගයේදී කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් වී තිබිය යුතුය); සහ පෙට්‍රල්, ඩීසල් වාහන වල යාන්ත්‍රික උපාංග දෝෂ හඳුනාගැනීම, උපාංග අළුත්වැඩියාව සහ වාහන අළුත්වැඩියාව පිළිබඳ සියළුම කටයුතු හා උපකරණ නඩත්තු කිරීම යන තනතුරට අදාළ කාර්යයන් පිළිබඳ වසර 2 ක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.); |
| | | | | *වෘත්තීය සුදුසුකම් :* |
| | | | | වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වැනි මට්ටමේ සහතිකය ලබා තිබීම; *හෝ* |
| | | | | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; *හෝ* |
| | | | | ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; *හෝ* |
| | | | | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීම් අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; *හෝ* |
| | | | | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. *හෝ* |
| | | | | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. |
| | | | | මේ සඳහා බඳවා ගනු ලබන්නේ පහත පරිදි වූ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මතය. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | ***ලිඛිත පරීක්ෂණය .:***<br>තනතුරට අදාළව පැවරී ඇති රාජකාරි පිළිබඳව න්‍යායාත්මක දැනුම පරීක්ෂා කරනු ලැබේ. (පැය 01 ලකුණු 100)<br><br>***ප්‍රායෝගික පරීක්ෂණය :***<br><br>මෙහිදී තනතුරට අදාළව පැවරී ඇති රාජකාරි ඉටු කිරීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගිකව පරීක්ෂා කරනු ලැබේ. (යන්ත්‍ර ක්‍රියාකරවීම, යන්ත්‍රයක කොටස් ගලවා සවි කිරීම, වෘත්තියට අදාළව පැවරී ඇති කාර්යයන්වල කොටසක් ඉටුකිරීම කළ යුතු අතර වෘත්තියට අදාළ ප්‍රායෝගික කොටස් පිළිබඳ පරීක්ෂණ මණ්ඩලය වාචිකව ප්‍රශ්න විමසනු ලැබේ. (පැය 1/2) (ලකුණු 100)<br>අවම වශයෙන් 40%ක් ලබාගත යුතුය.<br><br>***අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*** |
| 02. | විදුලි කම්බිකරු (ශිල්පීය III ශ්‍රේණිය) | 01 | PL-3-2006 -A<br>රු. 12,470 -10 x 130-10 x 145 -10 x 160 -12 x 170 -18,860/-<br>(හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර(සා.පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් වී තිබිය යුතුය);<br><br>සහ<br>විදුලි රැහැන් ඇදීම, වීථි ලාම්පු සවි කිරීම හා අළුත්වැඩියා කිරීම, විදුලි උපකරණ හෝ විදුලි උපාංග නඩත්තුව, සියළු විදුලි ස්ථාපන කටයුතු, විදුලිය බෙදා හැරීම, විදුලි සේවා නඩත්තුව, යන කටයුතුවලට අදාළව අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද ලබා තිබීම.<br>(රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.);<br><br>***වෘත්තීය සුදුසුකම් :***<br><br>වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) III වැනි මට්ටමේ සහතිකය ලබා තිබීම ;<br><br>*හෝ*<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br>හෝ<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීම් අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම; |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | *හෝ*<br>ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>මේ සඳහා බඳවා ගනු ලබන්නේ පහත පරිදි වූ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මතය.<br>***ලිඛිත පරීක්ෂණය :***<br>තනතුරට අදාළව පැවරී ඇති රාජකාරි පිළිබඳව න්‍යායාත්මක දැනුම පරීක්ෂා කරනු ලැබේ. (පැය 01 ලකුණු 100)<br>***ප්‍රායෝගික පරීක්ෂණය :***<br>විදුලි රැහැන් ඇදීම, වීථි ලාම්පු සවි කිරීම හා අළුත්වැඩියා කිරීම, විදුලි උපකරණ හෝ විදුලි විදුලි උපාංග නඩත්තුව, සියලු විදුලි ස්ථාපන කටයුතු, විදුලිය බෙදා හැරීම, විදුලි සේවා නඩත්තුව, යන කටයුතුවලට අදාළව, යන කටයුතු පිළිබඳ වෘත්තියට අදාළ ප්‍රායෝගික කොටස් පිළිබඳ පරීක්ෂණ මණ්ඩලය වාචිකව ද ප්‍රශ්න විමසනු ලැබේ. (පැ.1 1/2 ලකුණු 100)<br>අවම වශයෙන් 40%ක් ලබාගත යුතු ය. |
| 03. | රියැදුරු II "ආ" | 02 | PL - 3- 2006A<br>රු. 12,470 -<br>10 x 130 -10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860<br>(4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත්වී සිටිය යුතු ය.<br>***වෘත්තීය සුදුසුකම් :***<br>පෞද්ගලික/කුළී රථ සහ තාර බර හොණ්ඩර වැනි අඩු ස්ටේෂන් වැගන් ජීප් පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය.<br>***වෙනත් සුදුසුකම් :***<br>වාහන රියැදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.(සහතික මගින් සනාථ කළ යුතු ය)<br>අවම උස අඩි 05කට වැඩි විය යුතු ය.<br>දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කෙරෙන අතර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, මෝටර් වාහන පරීක්ෂකවරයෙකු, පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු හා ආයතනයේ නියෝජිතයෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතු ය. |
| 04. | මාර්ග කම්කරු<br>(වැඩ ක්ෂේත්‍ර කම්කරු)<br>(කා.සේ.සේ. III ) | 01 | PL - 1- 2006A<br>රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600<br>(4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අවම වශයෙන් 05 වැනි ශ්‍රේණිය/06 වසර සමත් විය යුතු ය. |

| අනු . අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| 10. | සෞඛ්‍ය කම්කරු (කා.සේ.සේ. III ) | 04 | PL - 1- 2006A රු.11,730-10x120-10x130 10x145-12x160-රු.17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අධ්‍යාපන සුදුසුකම් බල නොපායි. |

*01. නියමිත තනතුරු සඳහා වෙනත් පොදු සුදුසුකම් :*

(i) අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචියක් ඇත්තෙකු විය යුතු ය.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත)
(iii) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
(iv) අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) සේවා අවශ්‍යතාවයට අනුව විභාග ප්‍රතිඵල මත/විධිමත් සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
(ii) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2013.10.17 වැනි දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ජා ඇල ප්‍රාදේශීය සභාව, කඳාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ , පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු ය.)
(iii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතු යි.
(iv) අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් එවිය යුතු ය.
- (අ) උප්පැන්න සහතිකය ;
- (ආ) අධ්‍යාපන සහතික;
- (ඇ) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් සහතික කරගත් ග්‍රාමසේවක සහතිකය;
- (ඈ) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබාගත් එකක් විය යුතු ය.);
- (ඉ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .* – මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

04. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ ඒ අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ජාඇල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

05. අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී ලිඛිත විභාග/ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. (දෙමළ, ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට සැලකිය යුතු ය.)

එල්. ඒ. මංජුලා සමන්ති,
ලේකම්,
ජාඇල ප්‍රාදේශීය සභාව.

2013 සැප්තැම්බර් මස 09 වැනි දින,
ජා ඇල ප්‍රාදේශීය සභා කාර්යාලය,
කඳාන.

*ආදර්ශ අයදුම් පත්‍රය*

**ජාඇල ප්‍රාදේශීය සභාව**

**.......................................................................................... *තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
3. ස්ථිර ලිපිනය:——————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.

6. උපන් දිනය :
වර්ෂය:——————————. මාසය:——————————. දිනය:——————————.

7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.

8. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග ? :——————————.

9. විවාහක/අවිවාහක බව:——————————.

10. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

11. දුරකථන අංකය :——————————.

12. අධ්‍යාපන සුදුසුකම් :——————————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

13. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

14. සේවා පළපුරුද්ද :——————————.

15. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරුවකු වී ඇත්නම් එම වරදට ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න. :——
——————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවුත්, නිවැරදිවුත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

09-1198

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

මීරිගම ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මීරිගම ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර අධ්‍යාපන සහතිකවල වෘත්තීය සුදුසුකම් සහතිකවල, පදිංචිය සනාථ කිරීමේ සහතිකවල, උප්පැන්න සහතිකවල පිටපත් සමග "ලේකම්, මීරිගම ප්‍රාදේශීය සභාව, මීරිගම" යන ලිපිනයට 2013 ඔක්තෝබර් මස 15 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "..........(අදාළ) ........ "., තනතුර සඳහා ඉල්ලුම්පත යනුවෙන් සඳහන් කර එවිය යුතු ය. අසම්පූර්ණ මෙන්ම නියමිත දිනයට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රජයේ/පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| අනු. අංකය | තනතුර | සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කර්මාන්ත පරිපාලක | 01 | රු. 13,120-10x145-11x170-10x240-10 x 320 - රු. 22,040 හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ගණිතය/වාණිජ ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.<br>හෝ<br>(ආ) ජාතික අධ්‍යාපන පොදු සහතිකපත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 06න් සාමාර්ථය ලබා තිබීම.<br>හෝ<br>(ඇ) පළාත් පාලන ආයතනයක අවුරුදු 10ට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පංතිය සාමාර්ථය ලබා තිබීම. |

| අනු . අංකය | තනතුර | සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | සෞඛ්‍ය පරිපාලක | 01 | රු. 13,120-10x145-11x170-10x240-10 x 320 - රු. 22,040 හතර වැනි පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව/විද්‍යාව ඇතුළුව යටත් පරිසෙයින් විෂයයන් 05 සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වී තිබීම.<br>හෝ<br>(ආ) සිංහල/දෙමළ සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරන්නකු වීම,<br>හෝ<br>(ඇ) පළාත් පාලන ආයතනයක අවුරුදු 10ට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පංතිය සාමාර්ථය ලබා තිබීම. |
| 03 | කැබ් රථ රියදුරු (රියදුරු II ආ) | 01 | රු. 12,470-10x130-10x145-10x160- 12 x 170 - රු. 18,860 හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | සටහන අංක 01 බලන්න. |
| 04 | පුස්තකාල සහායක (කා.සේ. සේවයේ II) | 02 | රු. 12,210-10x130-10x145-10x160- 12 x 170 - රු. 18,600 හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයන් 06කින් සමත්ව තිබීම. |

*සටහන අංක 01 :-*

*රියදුරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන, වෙනත් සුදුසුකම් :-*

(i) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වැනි වසර සමත්වී සිටිය යුතුය ;
(ii) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය ;
(iii) වාහන රියැදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්ද තිබිය යුතුය (සහතික මගින් සනාථ කළ යුතුය) ;
(iv) අවම උස අඩි 05ක් විය යුතුය. ;
(v) දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. ;
(vi) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය හා මාර්ග නීති පිළිබඳ පරීක්ෂණවලින් අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

02. වෙනත් කොන්දේසි :-

(අ) සෞඛ්‍ය පරිපාලක හා සුළු පරිපාලක යන තනතුරු සඳහා බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්‍ෂා කරන පැය 01ක ප්‍රශ්න පත්‍රයකට මුහුණ දී එයින් සමත් විය යුතුය.

*පොදු කොන්දේසි :-*

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ආ) වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ඇ) තෝරාගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී පැමිණීම, වැඩ හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01ක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවාගනු ලැබේ.

*(ඈ)* අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 1 8ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.).

*(ඉ)* අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.

*(ඊ)* විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

*(එ)* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

*(ඒ)* අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

*(ඔ)* රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

*(අ)* මෙම තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95 ට අනුකූලව සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමෙන් තෝරාගනු ලැබේ.

*(ආ)* ලිඛිත හා ප්‍රායෝගික පරීක්‍ෂණ වලින් ලබාගන්නා ලකුණුවල කුසලතාවය මත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

*සැලකිය යුතුයි.*

මීරිගම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. මෙම බඳවා ගැනීම පිළිබඳ අවසාන තීරණය මීරිගම ප්‍රාදේශීය සභාව සතු බව කරුණාවෙන් සලකන්න.

කේ. ජයතිලක,<br>
ලේකම්,<br>
මීරිගම ප්‍රාදේශීය සභාව.

2013ක් වූ සැප්තැම්බර් මස 11 වැනි දින,<br>
මීරිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ .............................. තනතුර සඳහා අයදුම්පත්‍රය***

***මීරිගම ප්‍රාදේශීය සභාව***

1. මුලකුරු සමග නම :——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
2. ස්ථිර ලිපිනය :——————————.
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
5. උපන් දිනය : අවුරුද්ද :——————————, මාසය :——————————, දිනය :——————————.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
7. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————. විවාහක/අවිවාහක භාවය :——————
8. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.
9. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

   ඉගෙනගත් පාසැල :——————————.

   සමත් උසස්ම විභාගය :——————————.

10. (i) වෙනත් සුදුසුකම් :——————————.
    (ii) වෘත්තීය සුදුසුකම් :——————————.
    (iii) සේවා පළපුරුද්ද :——————————.

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :——————————.
    එම පත්වීමේ ස්වභාවය - ස්ථිර/අනියම්/තාවකාලික

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :——————————.

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

______________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු වන ...................................................................................... මයා/මිය/මෙය, මෙම ආයතනයේ ...................................................................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

______________,
ආයතන ප්‍රධානියා.

අත්සන :——————————.
නම :——————————.
පදවිය :——————————.
දිනය :——————————.

09-1202

---

# පළාත් පාලන නිවේදන

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වැලිගෙපොල ප්‍රාදේශීය සභාව විසින් 2013 පෙබරවාරි මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 6:1 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
වැලිගෙපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාත් සභාවේ,පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබ, 2011.01.28 දිනැති අංක 1691 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) වන කොටසේ පළ කරන ලද, සබරගමු පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2012.03.30 දිනැති අංක 1752 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරන ලද්දාවූ සබරගමුව පළාතේ මහ නගර සභා /නගර සභා/ප්‍රාදේශීය සභාවල මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වැලිගෙපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

09-1096

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.